අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## පුනරීක්ෂණ බහුවරණ ප්‍රශ්න

I කොටස


සැකසුම :

ට්‍රෙවින් මාලන්

නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස්,
දිවුරුම් කොමසාරිස් හා ලියාපදිංචි සමාගම් ලේකම්

☎ 0716 - 313 414 / 0718 - 259 564

1. ආර්ථික පරිසරයට අදාළ සාධක පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

| | | |
|---|---|---|
| A. | නීතිරීති, මිළ ගණන්, ජීවන මට්ටම, සිරිත් විරිත් | |
| B. | වැටුප් මට්ටම, ජීවන වියදම, පොළී මට්ටම, මිළ මට්ටම | |
| C. | වැටුප්, සිරිත් විරිත්, ආගමික කණ්ඩායම්, නාගරීකරණය | |
| D. | ජීවන වියදම, නීතිරීති, ආකල්ප, පුරුදු | |

2. ව්‍යාපාරිකයා තම ගණුදෙනුකරුවන් වෙනුවෙන් ඉටු කරන පහත සඳහන් කාර්යයන්ගෙන් ව්‍යාපාර ආචාරධර්මයක් ලෙස පිළිගත නොහැක්කේ,

| | | |
|---|---|---|
| A. | ගණුදෙනුකරුවන් නොරවටා භාණ්ඩ විකිණීමය. | |
| B. | භාණ්ඩ හා සේවාවන්හී ගුණත්වය පිළිබඳ අතිශෝක්තියෙන් වර්ණනා නොකිරීමය. | |
| C. | ගණුදෙනුකරුවන්ට වට්ටම් දීමය. | |
| D. | ගණුදෙනුකරුවන්ට ගෞරව කිරීම හා පිළිගැනීමය. | |

3. නීතිමය පුද්ගලභාවයක් නොමැති ව්‍යාපාර සංවිධානය වන්නේ,

| | | | | | |
|---|---|---|---|---|---|
| A. | සීමිත පොදු සමාගම්ය. | | B. | සීමිත පෞද්ගලික සමාගම්ය. | |
| C. | රාජ්‍ය සංස්ථාය. | | D. | හවුල් ව්‍යාපාරයන්ය. | |

4. කේවළ ස්වාමි ව්‍යාපාරයක් 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ලියාපදිංචි කළ යුත්තේ,

| | | |
|---|---|---|
| A. | ප්‍රාග්ධනය රු: 500,000 කට වැඩි වූ විටය. | |
| B. | ව්‍යාපාරිකයාගේ නමින් හැර වෙනත් නමකින් ව්‍යාපාරය ආරම්භ කරන විටදීය. | |
| C. | ව්‍යාපාරයේ නමට මුලින් "සීමිත" යන පදය භාවිතා කරන විටදීය. | |
| D. | ව්‍යාපාර දෙකක එකම නම පවතින විටකදීය. | |

5. ප්‍රවාහනයේ මූලිකාංග වඩාත් නිවැරදිව දැක්විය හැක්කේ,

| | | |
|---|---|---|
| A. | මාධ්‍ය, මාර්ගය, බලය හා නැවතුම්පොළ ලෙසය. | |
| B. | මාර්ගය, බලය, පර්යන්තය හා පිරිවැය ලෙසය. | |
| C. | බලය, පර්යන්තය, මාධ්‍ය හා ආරක්ෂාව ලෙසය. | |
| D. | පර්යන්තය, මාධ්‍ය, මාර්ගය හා ධාරිතාව ලෙසය. | |

6. සමන් තම මෝටර් රථය රු: 500,000 කට රක්ෂණය කර ඇත. ඔහුගේ මෝටර් රථය නවතා තිබූ තවත් මෝටර් රථයක ගැටිණි. ඔහුට සිදු වූ අලාභය රු: 75,000 ක් ලෙස ගණන් බලා රක්ෂණ ආයතනය විසින් එය ඔහුට ගෙවන ලදී. මෙසේ රු: 75,000 ක් ගෙවීමට අදාළ වූ රක්ෂණ මූලධර්මය කුමක්ද ?

| | | | | | |
|---|---|---|---|---|---|
| A. | ආදේශනය | | B. | හානිපූර්ණය | |
| C. | දායකත්වය | | D. | ආසන්නතම හේතුව | |

7. අසුරන ලද ආහාර ද්‍රව්‍යයක් මිළදී ගැනීමේදී පාරිභෝගිකයෙකු සලකා බැලිය යුත්තේ,

| | | |
|---|---|---|
| A. | මිළ, කල්ඉකුත්වන දිනය, ප්‍රමාණය හා අඩංගු ද්‍රව්‍ය | |
| B. | මිළ, ස්ථානය, කාලය හා පිරිවැය | |
| C. | ස්ථානය, කාලය, යෝග්‍යතාවය හා පිරිවැය | |
| D. | යෝග්‍යතාවය, මිළ, ස්ථානය හා කාලය | |

8. මූල්‍ය සේවා සපයන බැංකු නොවන මූල්‍ය ආයතන පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

| | | |
|---|---|---|
| A. | කල්බදු සමාගම්, වාණිජ බැංකු, මූල්‍ය සමාගම් | |
| B. | කල්බදු සමාගම්, ප්‍රාග්ධන ව්‍යවසායකත්ව සමාගම්, මූල්‍ය සමාගම් | |
| C. | කල්බදු සමාගම්, මූල්‍ය සමාගම්, මහජන බැංකුව | |
| D. | කල්බදු සමාගම්, වාණිජ බැංකු, වණික් බැංකු | |

9. විධිමත් දිගුකාලීන ආයෝජන මාර්ගයක් ලෙස සලකනු ලබන්නේ,

| | | | | | |
|---|---|---|---|---|---|
| A. | භාණ්ඩාගාර බිල්පත් මිළදී ගැනීමය | | B. | භාණ්ඩාගාර බැඳුම්කර මිළදී ගැනීමය | |
| C. | ඉඩම් මිළදී ගැනීමය | | D. | ස්වර්ණාභරණ මිළදී ගැනීමය | |

10. ගිණුම් පොත්වල සටහන් කළ හැකි ව්‍යාපාරික ගණුදෙනුවක් වන්නේ,

| | | |
|---|---|---|
| A. | ව්‍යාපාරය සඳහා හොඳ ගොඩනැගිල්ලක් තෝරා ගැනීම | |
| B. | ව්‍යාපාරයට දක්ෂ කළමණාකරුවෙකු මසකට රු: 50,000 ක වේතනයකට බඳවා ගැනීම | |
| C. | ව්‍යාපාරයේ කීර්තිනාමය ගණනය කිරීම | |
| D. | ව්‍යාපාරයට රු: 100,000 ක බැංකු ණයක් ගැනීම | |

Business & Accounting Studies - Trevin Marlon

11. පුද්ගලයෙකු තමාගේ ඉතුරුම් රු: 50,000 ක්ද බැංකු ණය රු: 25,000 ක්ද ලබාගෙන ව්‍යාපාරයක් ආරම්භ කරන අවස්ථාවේ ව්‍යාපාරයේ නිවැරදි ගිණුම්කරණ සමීකරණය වන්නේ,

| | | |
|---|---|---|
| A. | වත්කම් රු: 50,000 = ප්‍රාග්ධනය රු: 50,000 | |
| B. | වත්කම් රු: 75,000 = ප්‍රාග්ධනය රු: 75,000 | |
| C. | වත්කම් රු: 75,000 = ප්‍රාග්ධනය රු: 50,000 + වගකීම් රු: 25,000 | |
| D. | වත්කම් රු: 75,000 = ප්‍රාග්ධනය රු: 25,000 + වගකීම් රු: 50,000 | |

12. සරත් තමාගේ ව්‍යාපාරයේ බඩු තොගයෙන් රු: 1,000 ක් වටිනා භාණ්ඩ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගැනීම පොත්වල නිවැරදිව සටහන් විය යුත්තේ,

| | | | | | |
|---|---|---|---|---|---|
| A. | ප්‍රාග්ධන ගිණුම හර රු: 1,000<br>මුදල් ගිණුම බැර රු: 1,000 | | B. | ගැනිලි ගිණුම හර රු: 1,000<br>මුදල් ගිණුම බැර රු: 1,000 | |
| C. | ගැනිලි ගිණුම හර රු: 1,000<br>බඩු තොග ගිණුම බැර රු: 1,000 | | D. | ගැණුම් ගිණුම හර රු: 1,000<br>ප්‍රාග්ධන ගිණුම බැර රු: 1,000 | |

13. ගැණුම් ජ'නලය පිළිබඳව දැක්වෙන පහත සඳහන් ප්‍රකාශවලින් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.

| | | |
|---|---|---|
| A. | ව්‍යාපාරයේ සියළුම ගැණුම් සටහන් කරයි. | |
| B. | නැවත විකිණීමේ පරමාර්ථයෙන් කෙරෙන ණයට ගැණුම් පමණක් සටහන් කරයි. | |
| C. | ගැණුම් ජ'නලයේ එකතුව ගැණුම් ගිණුමට හර කරයි. | |
| D. | ගැණුම් ජ'නලයේ සටහන් කිරීම සඳහා යොදා ගන්නා මූලාශ්‍ර ලේඛණය ගැණුම් ඉන්වොයිසියයි. | |

14. 'වාණිජ්‍යය' යන්න වඩාත් හොඳින් අර්ථ දැක්වෙන ප්‍රකාශය කුමක්ද ?

| | | |
|---|---|---|
| A. | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන විශයයෙහි එක් කොටසකි. | |
| B. | මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීමේ ක්‍රියාවලියකි. | |
| C. | වෙළඳාම සම්බන්ධ විශ්ලේෂණය කරන විෂයයකි | |
| D. | වෙළඳාමේ හා උපකාරක සේවාවන්ගේ එකතුවකි. | |

15. අතිරික්ත නිෂ්පාදනය නිසා 'භාණ්ඩ හුවමාරු ක්‍රමය' ඇති වු අතර එහි ප්‍රතිඵලය වුයේ,

| | | | | | |
|---|---|---|---|---|---|
| A. | අතිරික්තය ප්‍රතිව්‍යාප්ත වීමකි. | | B. | තවදුරටත් නිෂ්පාදනයට පෙළඹවීමයි. | |
| C. | භාණ්ඩවල අයිතිය වෙනස්වීමකි | | D. | වුවමනා තෘප්තිමත් වීමකි | |

16. ව්‍යාපාර ආයතනයක් සරළව හැඳින්විය හැක්කේ,

| | | |
|---|---|---|
| A. | සිල්ලර හෝ තොග වෙළඳසැලක් වශයෙනි. | |
| B. | පාරිභෝගිකයන්ට අවශ්‍යම ස්ථානයක් වශයෙනි | |
| C. | කිසියම් මිළකට භාණ්ඩ හා සේවා හුවමාරු කිරීමට සුදානම් ආයතනයක් වශයෙනි | |
| D. | ලාභ අපේක්ෂාවෙන් සම්පත් යොදවා කේවළ හෝ හවුල් පවත්වාගෙන යන්නක් වශයෙනි | |

17. සිය මූලික අවශ්‍යතා සපුරාගත් පුද්ගලයෙකු විසින් තම ද්විතීයික අවශ්‍යතා සපුරා ගැනීමට කළ යුතු වන්නේ,

| | | | | | |
|---|---|---|---|---|---|
| A. | අවශ්‍යතා ප්‍රමාඛතාවන් පෙළ ගැස්වීමයි | | B. | වුවමනා තෘප්තිමත් කර ගැනීමයි | |
| C. | නාගරික දිවියට අවතීර්ණ වීමයි | | D. | දියුණු විදේශ රටක පදිංචියට යාමයි | |

18. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරවල මෙහෙයුම් කටයුතු කෙරේ දේශපාලන පරිසරයද බලපායි. දේශපාලන පරිසරයට අදාළ නොවන කාරණය වන්නේ,

| | | |
|---|---|---|
| A. | රජයේ ව්‍යාපාර පෞද්ගලීකරනය හෝ ප්‍රතිව්‍යුහගත කිරීමයි | |
| B. | රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමය | |
| C. | ඉන්ධන මිළ සීඝ්‍රයෙන් ඉහළ යාමය | |
| D. | ජනාධිපතිවරණ හා පාර්ලිමේන්තු මැතිවරණය | |

19. වෙළඳපොළ ඉලක්ක කරගෙන කරනු ලබන නිෂ්පාදනය හඳුන්වනු ලබන්නේ,

| | | | | | |
|---|---|---|---|---|---|
| A. | ඍජු නිෂ්පාදනය වශයෙනි | | B. | වක්‍ර නිෂ්පාදනය වශයෙනි | |
| C. | වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය වශයෙනි | | D. | ඉල්ලුම පදනම්වු නිෂ්පාදනය වශයෙනි | |

20. සුනාමි විපතට පත්වු ප්‍රදේශවල ජනතාවට සන්නිවේදන පහසුකම් කඩිනමින් ලබාදීම අයත් වනුයේ,

| | | | | | |
|---|---|---|---|---|---|
| A. | රාජ්‍ය සේවා අංශයටය | | B. | ප්‍රාථමික සේවා අංශයටය | |
| C. | ද්විතීයික සේවා අංශයටය | | D. | තෘතීය සේවා අංශයටය | |

21. මිළට ගැනීමේ හැකියාව අඩුවුවත් පාරිභෝගික ආකල්ප මත වාරික වශයෙන් ගෙවා මිළට ගැනීමට ආයාසයක් දරණ භාණ්ඩ වන්නේ,

| | | | | | |
|---|---|---|---|---|---|
| A. | විශේශිත භාණ්ඩ | | B. | පහසු භාණ්ඩ | |
| C. | සාප්පු භාණ්ඩ | | D. | නොසෙවු භාණ්ඩ | |

Business & Accounting Studies - Trevin Marlon

22. තොග වෙළඳාමට පමණක් අදාළ වන්නේ,

| | | |
|---|---|---|
| A. | භාණ්ඩ විශාල තොග වශයෙන් විකිණීමයි. | |
| B. | නිෂ්පාදකයාගෙන් කෙළින්ම භාණ්ඩ ලබාගෙන විකිණීමයි. | |
| C. | නැවත විකිණීමේ චේතනාවෙන් මිළදී ගන්නා ගැණුම්කරුවන්ට භාණ්ඩ විකිණීමයි. | |
| D. | පරිභෝජනය සඳහා භාණ්ඩ මිළදී ගන්නන්ට භාණ්ඩ විකිණීමයි. | |

23. කිසියම් පුද්ගලයෙකුට පහත සඳහන් විවිධ ආකාරයන්ගෙන් තමාට අවශ්‍ය නිෂ්පාදනයන් ලබාගත හැකිය. එයින් ශ්‍රී ලංකාවේ පිළිගත් සමාජ හා වෙළඳ ආචාර ධර්මවලට පටහැනි ක්‍රමය කුමක්ද ?

| | | | | | |
|---|---|---|---|---|---|
| A. | ස්වයං නිෂ්පාදනය | | B. | හුවමාරුව | |
| C. | බලහත්කාරය | | D. | හිඟමන් ගැනීම | |

24. වෙළඳපොළට ඉදිරිපත් කෙරෙන කිසියම් නිෂ්පාදිතයක් ඉලක්ක ගැණුම්කරුට වඩාත් සාර්ථකව අලෙවි කිරීමට නම්,

| | | |
|---|---|---|
| A. | ක්‍රය ශක්තිය ඇති මිළදී ගන්නාට එමගින් තෘප්තියක් ලැබිය යුතුය | |
| B. | මිළදී ගන්නාගේ ක්‍රය ශක්තිය ශක්තිමත් විය යුතුය | |
| C. | මිළදී ගන්නා පමණක් නොව පවුලේ අයද කැමති විය යුතුය | |
| D. | එය නීති විරෝධී නොවන්නක් විය යුතුය | |

25. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ව්‍යාපාර විවිධ ආකාරයෙන් වර්ගීකරණය කළ හැකිය. කේවළ ස්වාමි, හවුල්, සමාගම් යනුවෙන් ව්‍යාපාර හඳුන්වනු ලබන්නේ කවර වර්ග කිරීමේ ප්‍රභේදයකට අනුවද ?

| | | | | | |
|---|---|---|---|---|---|
| A. | වෙළඳ පොළ ස්වභාවය | | B. | ව්‍යාපාරයේ ප්‍රමාණය හා සංකීර්ණත්වය | |
| C. | ව්‍යාපාර සපයන භාණ්ඩ හා සේවා | | D. | ව්‍යාපාර සංවිධාන ක්‍රමය අනුව | |

26. කොටස් වෙළඳපොළ ඇතුළු දිගුකාලීන අරමුදල් සැපයීම සඳහා කටයුතු කරන වෙළඳපොළ හඳුන්වනුයේ,

| | | | | | |
|---|---|---|---|---|---|
| A. | භාණ්ඩ වෙළඳපොළ | | B. | ප්‍රාග්ධන වෙළඳපොළ | |
| C. | ප්‍රාග්ධන භාණ්ඩ වෙළඳපොළ | | D. | කාර්මික වෙළඳපොළ | |

27. මුදල්වල විකාශනයේ නූතන ප්‍රවණතාව ලෙස සැලකිය හැක්කේ,

| | | |
|---|---|---|
| A. | මුදල් නිකුත් කිරීම තවදුරටත් රජයේ අධිකාරිය මගින් කරගෙන යාමයි | |
| B. | සියළු සදාචාර පසෙක ලා මිනිසා මුදල් ඉපැයීම කෙරෙහිම වැඩි අවධානයක් යොමු කිරීමයි | |
| C. | නීත්‍යානුකූල මුදල් තරමටම කළු මුදල් ප්‍රබලවීමයි | |
| D. | විද්‍යුත් මුදල් ක්‍රම භාවිතය දිනෙන් දින ප්‍රබල වෙමින් පැවතීමයි | |

28. මිනිසාගේ මූලික අවශ්‍යතා වන්නේ,

| | | | | | |
|---|---|---|---|---|---|
| A. | ආහාර, ඇඳුම්, පොත්පත් හා නිවාස | | B. | ආහාර, ඇඳුම්, නිවාස හා සෞඛ්‍යය | |
| C. | ආහාර, අධ්‍යාපනය, පොත්පත් හා සෞඛ්‍යය | | D. | ප්‍රවාහනය, සන්නිවේදනය, ඇඳුම් හා සෞඛ්‍යය | |

29. උපකාරක සේවාවක් ලෙස සැලකිය නොහැක්කේ,

| | | | | | |
|---|---|---|---|---|---|
| A. | සිල්ලර වෙළඳාමයි | | B. | සන්නිවේදනයයි | |
| C. | ගබඩාකරණයයි | | D. | ප්‍රවාහනයයි | |

30. නීතිය අනුව ගණුදෙනු කළ නොහැකි ලියවිලි ගණයට ඇතුළත් නොවන්නේ,

| | | | | | |
|---|---|---|---|---|---|
| A. | පොරොන්දු නෝට්ටුය | | B. | විනිමය බිල්පත්‍ය | |
| C. | ලාභාංශ බලපත්‍රය | | D. | චෙක්පත්‍ය | |

31. සැළසුම්කරණය යනු,

| | | |
|---|---|---|
| A. | අතීතය සඳහා වූ ක්‍රියාවලියකි | |
| B. | වර්තමානය සඳහා වන ක්‍රියාවලියකි | |
| C. | අනාගතය සඳහා වන ක්‍රියාවලියකි | |
| D. | අතීත අත්දැකීම් පදනම් කරගෙන වර්තමාන ගැටළු විසඳීම සඳහා වූ වැඩපිළිවෙළකි | |

32. ගණුදෙනුකරුවෙකු භාණ්ඩ මිළදී ගැනීම සඳහා සැපයුම්කරුවෙකු වෙත අත්තිකාරම් වශයෙන් රු: 5,000 ක් ගෙ තිබුණි. භාණ්ඩ විකුණුම්කරුගේ පොත්වල මෙය සටහන් කෙරෙන්නේ,

| | | |
|---|---|---|
| A. | මුදල් ගිණුම හර - අත්තිකාරම් ගිණුම බැර | |
| B. | මුදල් ගිණුම හර - විකුණුම් ගිණුම බැර | |
| C. | ගණුදෙනුකරුගේ ගිණුම හර - ගෙවීම් ගිණුම බැර | |
| D. | ගණුදෙනුකරුගේ ගිණුම හර - විකුණුම් ගිණුම බැර | |

Business & Accounting Studies - Trevin Marlon

**33.** නිවැරදි ගිණුම් සමීකරණය තෝරන්න,

| | | |
|---|---|---|
| A. | ප්‍රාග්ධනය + වියදම් + වගකීම් = වත්කම් + ආදායම් | |
| B. | ප්‍රාග්ධනය + ආදායම් + වගකීම් = වත්කම් + වියදම් | |
| C. | ප්‍රාග්ධනය + ආදායම් + වත්කම් = වගකීම් + වියදම් | |
| D. | ප්‍රාග්ධනය + වත්කම් + වියදම් = වගකීම් + ආදායම් | |

**34.** පහත ගනුදෙනු අතරින් ව්‍යාපාරික ගනුදෙනුවක් නොවන්නේ,

| | | |
|---|---|---|
| A. | ව්‍යාපාරයට වෘත්තීය සුදුසුකම් ඇති කළමණාකරුවෙකු බඳවා ගැනීම | |
| B. | ගෙවල් කුලිය රු: 5,000 ක් ගෙවීම | |
| C. | බැංකුවේ තැන්පත් කරන ලද රු: 1,000 ක චෙක්පතක් අගරුවීම | |
| D. | විදුලි තරාදියක් රු: 25,000 ක් ගෙවා ව්‍යාපාරයට ගත්තා | |

**35.** රු: 5,000 කට මිළටගත් භාණ්ඩ රු: 5,000 කට ණයට විකිණීම යන ගනුදෙනුවේ ප්‍රතිඵලය නිවැරදිව ප්‍රකාශ වන්නේ පහත සඳහන් කවර වාක්‍ය ඛණ්ඩයෙහි ද ?

| | | | | | |
|---|---|---|---|---|---|
| A. | වත්කම් අඩුවීම - ආදායම් වැඩිවීම | | B. | වත්කම් අඩුවීම - වත්කම් වැඩිවීම | |
| C. | වත්කම් අඩුවීම - හිමිකම් වැඩිවීම | | D. | වත්කම් අඩුවීම - වියදම් වැඩිවීම | |

**36.** චෙක්පතකින් ගෙවීමක් කළ විට එය ගෙවූ බවට සනාථ කිරීමට තමා ළඟ ඇති මූලික ලියවිල්ල වන්නේ,

| | | | | | |
|---|---|---|---|---|---|
| A. | හරපත | | B. | බැරපත | |
| C. | පිළිපත | | D. | ඉන්වොයිසිය | |

**37.** මුදල් පොතක් සකස් කිරීමේදී ප්‍රති සටහන් ලිවීම අවශ්‍ය වන්නේ පහත කවර ගනුදෙනුව සඳහාද ?

| | | |
|---|---|---|
| A. | ගනුදෙනුකරුවෙකු විසින් එවන ලද චෙක්පතක් අගරුවීම | |
| B. | චෙක්පතක් නිකුත් කර බැංකුවෙන් මුදල් ලබාගැනීම | |
| C. | කොමිස් මුදලක් අය නොකර මිත්‍රයෙකුගේ චෙක්පතක් මුදල්කර දීම | |
| D. | ණයහිමියන්ගෙන් වට්ටම් ලැබීම හා ණයගැතියන්ට වට්ටම් දීම | |

**38.** ආපසු යැවුම් ජ'නලය සකස් කිරීමේදී පොත් තබන්නෙකු භාවිතා කරන මූලික ලියවිල්ල කුමක්ද ?

| | | | | | |
|---|---|---|---|---|---|
| A. | වවුචරය | | B. | හරපත | |
| C. | නාමමාත්‍ර ඉන්වොයිසිය | | D. | සැපයුම්කරුවන්ගේ ඉන්වොයිසිය | |

**39.** ණයහිමියෙකු වූ අබුට ගෙවන ලද රු: 500 ක මුදල මුදල් පොතේ නිවැරදිව සටහන්ව ඇති නමුත් අබුගේ ගිණුමේ සටහන් වී නැත. මෙම වරද නිවැරදි කිරීමට අදාළ නිවැරදි ජ'නල් සටහන කුමක්ද ?

| | | | | | |
|---|---|---|---|---|---|
| A. | අබුගේ ගිණුම හර රු: 500<br>අවිනිශ්චිත ගිණුම බැර රු: 500 | | B. | අබුගේ ගිණුම හර රු: 500<br>මුදල් ගිණුම බැර රු: 500 | |
| C. | අවිනිශ්චිත ගිණුම හර රු: 500<br>අබුගේ ගිණුම බැර රු: 500 | | D. | මුදල් ගිණුම හර රු: 500<br>අබුගේ ගිණුම බැර රු: 500 | |

**40.** කොළඹ කොටස් වෙළඳපොළේ ගනුදෙනුවන සුරැකුම්පත් වර්ග දෙකක් වන්නේ,

| | | | | | |
|---|---|---|---|---|---|
| A. | කොටස් හා ණයකර | | B. | කොටස් හා භාණ්ඩාගාර බිල්පත් | |
| C. | ණයකර හා භාණ්ඩාගාර බිල්පත් | | D. | භාණ්ඩාගාර බැඳුම්කර හා කොටස් | |

**41.** බැංකු සැසඳුම් විස්තරය යන්නෙන් අදහස් වන්නේ,

| | | |
|---|---|---|
| A. | බැංකු ප්‍රකාශනයේ ශේෂය මුදල් පොතේ බැංකු ශේෂය සමඟ සැසඳීමයි | |
| B. | බැංකු ගිණුම් විස්තරය අධ්‍යයනය කිරීමයි | |
| C. | පෙර මාසයේ බැංකු ප්‍රකාශය සමඟ මෙම මාසයේ බැංකු ප්‍රකාශය සැසඳීමයි | |
| D. | මුදල් පොත අදාළ තොරතුරු ආශ්‍රයෙන් සංශෝධනය කිරීමයි | |

**42.** 2011 නොවැම්බර් 30 දිනට මුදල් පොතේ බැංකු තීරුවේ දැක්වෙන ශේෂය රු: 4,500 කි. බැංකුවේ තැන්පත් කල නමුත් බැංකු ගිණුම් විස්තරයේ සඳහන් වී නැති චෙක්පත්වල වටිනාකම රු: 6,000 කි. එමෙන්ම නිකුත් කළ නමුත් මුදල් ලබාගැනීම සඳහා බැංකුවට ඉදිරිපත් වී නැති චෙක්පත්වල වටිනාකම රු: 3,000 කි. 2011 නොවැම්බර් 30 දිනට ව්‍යාපාරයේ බැංකු සැසඳුම පිළියෙල කළේ නම් එදිනට බැංකුවේ ඇති ශේෂය වන්නේ,

| | | | | | |
|---|---|---|---|---|---|
| A. | රු: 1,500 | | B. | රු: 7,500 | |
| C. | රු: 10,500 | | D. | රු: 14,000 | |

**43.** ශේෂ පිරික්සුමක වෙනසක් ඇති වූ විට එම වෙනස තාවකාලිකව ඇතුළත් කරන්නේ,

| | | | | | |
|---|---|---|---|---|---|
| A. | ලාභාලාභ ගිණුමේය | | B. | වෙළඳ ගිණුමේය | |
| C. | අවිනිශ්චිත ගිණුමේය | | D. | ප්‍රාග්ධන ගිණුමේය | |

Business & Accounting Studies - Trevin Marlon

44. වෙළඳ හා ලාභාලාභ ගිණුම සකස් කළ පසු ලෙජරයේ ඇති පියවී යන ගිණුම් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| A. | වියදම් හා ප්‍රාග්ධන ගිණුම් | | B. | ආදායම් හා වියදම් ගිණුම් | |
| C. | වත්කම් හා වගකීම් ගිණුම් | | D. | ප්‍රාග්ධන හා වගකීම් ගිණුම් | |

45. පහත සඳහන් ගණුදෙනු අතරින් තොගයට හා ශුද්ධ ලාභයට බලපෑමක් වන ගණුදෙනුව තෝරන්න.

| | | |
|---|---|---|
| A. | මුතුමිණි සමාගමෙන් රු: 15,000 ක භාණ්ඩ ණයට ගැනීම | |
| B. | රු: 25,000 ක භාණ්ඩ රු: 32,000 කට ණයට විකිණීම | |
| C. | රු: 200 ක් මුදලින් ගෙවා තොගයක් මිළට ගැනීම | |
| D. | රු: 1,500 ක භාණ්ඩ තොගයක් අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම | |

46. හර - බැර සටහන් දෙකම (ප්‍රති සටහන්) ද්විත්ව තීරු මුදල් පොතක දැකිය හැක්කේ,

| | | |
|---|---|---|
| A. | ණයගැතියෙකුගෙන් චෙක්පතක් ලැබීමේදීය. | |
| B. | තැන්පත් කළ චෙක්පතක් අගරුවීමේදීය. | |
| C. | ව්‍යාපාරයේ චෙක්පතකින් බැංකුවෙන් මුදල් ලබාගැනීමේදීය. | |
| D. | චෙක්පතක් මගින් වැටුප් ගෙවීමේදීය. | |

47. අයභාර වියදම් පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

| | | |
|---|---|---|
| A. | වැටුප්, ගෙවල්කුලී, ප්‍රචාරණ, ගෙවල්කුලී | |
| B. | රක්ෂණ ගෙවීම, ගොඩනැගිලි මිළට ගැනීම, වේතන ගෙවීම, ප්‍රවාහන ගාස්තු | |
| C. | යන්ත්‍රයක් ගැනීම, මෝටර් රථයක් ගැනීම, ගොඩනැගිලි මිළට ගැනීම, බැංකු ණය ගෙවීම | |
| D. | වරිපණම් ගෙවීම, ආදායම් බදු ගෙවීම, තොග මිළට ගැනීම, ක්ෂය කපා හැරීම | |

48. කම්හල් පොදු කාර්යය පිරිවැය සමන්විත වන්නේ,

| | | | | | |
|---|---|---|---|---|---|
| A. | සෘජු ද්‍රව්‍ය හා වක්‍ර ද්‍රව්‍ය වලිනි | | B. | සෘජු ද්‍රව්‍ය හා සෘජු ශ්‍රමයෙනි | |
| C. | වක්‍ර ද්‍රව්‍ය හා සෘජු ශ්‍රමයෙනි | | D. | ප්‍රාථමික පිරිවැය නොවන පිරිවැය වලිනි | |

49. ශේෂ පිරික්සුමේ දැක්වෙන අඩමාණ ණය වෙන්කිරීම රු: 1,000 කි. ණයගැතියන්ගේ ශේෂය රු: 25.000 කි. ව්‍යාපාරය අනුගමනය කරන අඩමාණ ණය වෙන්කිරීමේ ප්‍රතිපත්තිය වන්නේ ණයගැති ශේෂය වෙනුවෙන් 5% ප්‍රතිපාදනය කිරීමයි. ඒ අනුව ලාභාලාභ ගිණුමට හර කළ යුතු ප්‍රමාණය කොපමණද ?

| | | | | | |
|---|---|---|---|---|---|
| A. | රු: 250 කි. | | B. | රු: 1,000 කි. | |
| C. | රු: 1.250 කි. | | D. | රු: 2,250 කි. | |

50. ශේෂ පත්‍රය නිර්වචනය කිරීමට වඩාත් සුදුසු ප්‍රකාශය තෝරන්න.

| | | |
|---|---|---|
| A. | ව්‍යාපාරයේ අවසාන ගිණුම් කට්ටලයට අයත් ප්‍රකාශනයකි. | |
| B. | ලාභාලාභ ගිණුම මෙන් ගිණුමක් නොව හුදෙක්ම ප්‍රකාශනයකි. | |
| C. | මුල්‍ය තත්ත්වය විදහා දැක්වීමට සෑම ව්‍යාපාරයක්ම අනිවාර්යෙන් සැකසිය යුත්තකි. | |
| D. | ලාභාලාභ ගිණුම පිළියෙල කළ පසු ඉතිරිවන සෙසු ගිණුම්වල ශේෂ භාවිතා කොට නිශ්චිත දිනකට මුල්‍ය තත්ත්වය සාධාරණ ලෙස පෙන්වීමට පිළියෙල කරන ප්‍රකාශයකි. | |

❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑❑

දෙවන කොටස බලාපොරොත්තු වන්න................

*මෙවර අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් උසස් ජයග්‍රහණයක් ලැබ සාර්ථක අනාගතයක් කරා ගමන් කිරීමට අවශ්‍ය ශක්තිය හා ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.*

නීතිඥ **ට්‍රෙවින් මාලන්.**

**උසස් පෙළ : ගිණුම්කරණය , ව්‍යාපාර අධ්‍යයනය.**
**සාමාන්‍ය පෙළ : ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය.**

**විමසීම් :** 183 / **A** , දේවාල පාර , පමුණුව , මහරගම.
**Tel: 0716 – 313 414, 0112 – 850 939, 0718 – 259 564**
E-mail: trevinmarlon@gmail.com
trevin_marlon@yahoo.com

Business & Accounting Studies - Trevin Marlon